

# ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය

ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ලෝක බැංකු ප්‍රතිපාදන හා ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපාදන මත ක්‍රියාත්මක වන පස් අවුරුදු (2020-2025) ව්‍යාපෘතියකි. ව්‍යාපෘතියේ මුලු පිරිවැය ඇ.ඩො. මිලියන 75.03 කි.

## IWWRMP ව්‍යාපෘතිය

- ජල සම්පතෙහි තිරසර බව තහවුරු කරයි.
- රාජ්‍ය ආයෝජන වැඩසටහන (2017 - 2020) සමඟ අනුගත ව්‍යාපෘතියකි.
- ජාතික ප්‍රතිපත්ති රාමුවට අනුගත ව්‍යාපෘතියකි.
- දේශගුණ විපර්යාසයන්ගේ අහිතකර බලපෑම් අවම කිරීමට හා ඒ සඳහා අනුගත වීමට දායකත්වය සපයයි.
- තිරසර සංවර්ධන අභිමතාර්ථ සපුරාලයි.

## ව්‍යාපෘතියේ අරමුණ

- ජල පෝෂක ප්‍රදේශ හා ජල සම්පත් සැලසුම්කරණය වැඩිදියුණු කිරීම සහ ජලය හා සම්බන්ධ යටිතල පහසුකම්වල ක්‍රියාකාරීත්වය ඉහළ නැංවීම.

## ප්‍රධාන ව්‍යාපෘති සංරචක

- පළමු සංරචකය - ජල පෝෂක ප්‍රදේශ සහ ජල සම්පත් සැලසුම්කරණය (ඇ.ඩො.මි. 13.7)
  මේ යටතේ ඉහළ මහවැලි ජල පෝෂක ප්‍රදේශය සඳහා කළමනාකරණ සැලසුම සැකසීම, ජල පෝෂක ප්‍රදේශය ප්‍රතිස්ථාපනය හා බහු අංශික ජල සම්පත් සැලසුම්කරණය සිදුකරනු ලබයි. මේ යටතේ උප සංරචක 03 කි.
  - 1.1 ජල පෝෂක ප්‍රදේශ කළමනාකරණය (ඇ.ඩො.මි. 1.0)
  - 1.2 ජල පෝෂක ප්‍රදේශ ප්‍රතිස්ථාපනය (ඇ.ඩො.මි. 5.0)
  - 1.3 බහු අංශික ජල සම්පත් සැලසුම්කරණය (ඇ.ඩො.මි. 7.7)

- දෙවන සංරචකය - වාරි යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම (ඇ.ඩො.මි. 57.8)
  මේ යටතේ අවදානමට ලක්ව ඇති ජලාශ වේලි 36 ක් හා ඇළ මාර්ග පද්ධති 19 ක් ප්‍රතිසංස්කරණය කරනු ලබයි.

Ministry of Irrigation

IWWRMP

THE WORLD BANK

වාරි සෞභාග්‍යා
நீர்ப்பாசன செழுமை

**ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය**

**වාරිමාර්ග අමාත්‍යාංශය**

## ව්‍යාපෘතියේ ප්‍රධාන සංරචක පිළිබඳ තොරතුරු

| සංරචකය | සංරචකයේ ප්‍රධාන අරමුණු | ප්‍රධාන පාර්ශව ආයතන |
| --- | --- | --- |
| පළමු සංරචකය | ඉහළ මහවැලි ජල පෝෂක ප්‍රදේශය සැලසුම්කරණයට සහ ප්‍රතිස්ථාපනයට සහය දැක්වීම.<br><br>භූගත ජල කළමනාකරණය ස්වයංක්‍රීය ජල කාලගුණික මිනුම් පද්ධතියක් ස්ථාපිත කිරීම හා ජල සම්පත කළමනාකරණය හා සම්බන්ධ ආයතන සවිබල ගැන්වීම. | ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, හදබිම අධිකාරිය, ස්වභාවික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානය, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, දිස්ත්‍රික් ලේකම් කාර්යාල (මහනුවර, නුවරඑළිය හා බදුල්ල), කුඩා තේවතු සංවර්ධන අධිකාරිය, මධ්‍යම පරිසර අධිකාරිය, පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව (මධ්‍යම හා ඌව), පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව (මධ්‍යම හා ඌව), පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව (මධ්‍යම හා ඌව), ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය, ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය සහ ජල සම්පත් මණ්ඩලය. |
| දෙවන සංරචකය | ජලය හා සම්බන්ධ යටිතල පහසුකම්වල කාර්යක්ෂමතාව, ආරක්ෂාව සහ කල් පැවැත්ම ඉහළ නැංවීම සහ නිසි කළමනාකරණයක් හා සුපරීක්ෂණයක් තහවුරු කිරීම පිණිස ආයතනික සැකැස්මට සහය දැක්වීම. | ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, උතුරු පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ නැගෙනහිර පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව. |

- පළමු සංරචකයට අදාළ වැඩසටහන් ඉහළ මහවැලි ජල පෝෂක ප්‍රදේශය ආවරණය කරමින් මහනුවර, නුවරඑළිය හා බදුල්ල දිස්ත්‍රික්කවලට අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 31 ක ක්‍රියාත්මක වේ.

- දෙවන සංරචකයට අදාළ වැඩසටහන් දිවයිනේ පළාත් 07 ක් ආවරණය කරමින් ක්‍රියාත්මක වේ.

### යෝජිත වැඩසටහන්

## පළමු සංරචකය

- වගා බිම් තුළ හා ඉන් බැහැරව පාංශු හා ජල සංරක්ෂණය, නැවත වන වගාව, ගංගා ඉවුරු සංරක්ෂණය, අබලන් වූ කුඩා වැව් ප්‍රතිසංස්කරණය, ගෙවතු සංවර්ධනය හා ජීවනෝපාය සංවර්ධනය.

- භූගත ජල කළමනාකරණ සැලසුම් සකස් කිරීම සහ ජල සම්පත් කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා ස්වයංක්‍රීය ජල කාලගුණික මිනුම් පද්ධතියක් ස්ථාපිත කිරීම.

## දෙවන සංරචකය

- අවදානමට ලක්වූ ජලාශ, වේලි ආශ්‍රිත වාරි මාර්ග හා ජල බෙදුම් ඇළ මාර්ග මෙන්ම ඒ ආශ්‍රිත ව්‍යුහයන් ප්‍රතිසංස්කරණය.

ව්‍යාපෘති අධ්‍යක්ෂ
ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත්
කළමනාකරණ ව්‍යාපෘතිය
දෙවන මහල, මහවැලි කේන්ද්‍රය,
අංක 96, ආනන්ද කුමාරස්වාමි මාවත, කොළඹ 07.
දුරකථන අංකය : 0112691163
විද්‍යුත් ලිපිනය : iwwrmp@sltnet.lk

ඒකාබද්ධ ජලාධාර සහ ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතියේ පළමු හා දෙවන සංරචක යටතේ වැඩසටහන් ක්‍රියාත්මක වන ස්ථාන

